ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU5354** - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සෞන්දර්යය
කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - **2023.02.11** වේලාව - ප.ව.**01.30** - ප.ව.**03.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ අවබෝධය ප්‍රාථමික පන්තිකාමරයේ ගුරුවරයෙකු සඳහා අවශ්‍ය වන්නේ ඇයි? පැහැදිලි කරන්න.

02. ළමා කවි ප්‍රාථමික පාසල් සිසුන්ගේ චිත්තවේගීය සංවර්ධනයට දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රාථමික පන්තිකාමරයේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී ගුරුවරයෙකු මුහුණ දෙන අභියෝග පහක් (05) දක්වන්න.

04. ප්‍රාථමික අධ්‍යාපනය ලබන ශිෂ්‍යයාට නර්තන විෂයයේ ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

05. "භාව ප්‍රකාශනය" යන්න කෙටියෙන් විස්තර කරන්න.

06. ප්‍රාථමික අවධියේ දරුවන් චිත්‍ර ඇඳීමේ ක්‍රියාවලිය තුළින් අත්කර ගන්නා කුසලතා පහක් **(05)** දක්වන්න.

07. බහුවිධ බුද්ධි න්‍යායට අදාල බුද්ධි වර්ග අට **(08)**දක්වන්න.

08. ළමා චිත්‍ර සංවර්ධන අවධිවල පළමු අවධිය නම් කර, එහි මූලික ලක්ෂණ දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. ශිෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනයට සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් කෙතරම් බලපෑමක් කරයි ද? විස්තර කරන්න. (ලකුණු 08)

ii. ප්‍රාථමික අධ්‍යාපනය තුළ සෞන්දර්ය අධ්‍යාපනය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම විගොට්ස්කිගේ (Vygotsky) අධ්‍යාපන න්‍යායට අනුව සුදුසු උදාහරණ දක්වමින් විභාග කරන්න. (ලකුණු 12)

10. i. මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ප්‍රාථමික සිසුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සැළසුම් කිරීමේ දී ගුරුවරයා මුහුණදෙන අභියෝග තුනක් (03) දක්වා, එම අභියෝග ජය ගැනීමට ඔබට දිය හැකි යෝජනා විස්තරාත්මක ව ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

ii. සෞන්දර්යාත්මක හා නිර්මාණශීලී සංසිද්ධීන් ප්‍රාථමික පන්තිකාමරය තුළ සැළසුම් කිරීමේ දී ගුරුවරයාගේ කාර්යය භාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.(ලකුණු 12)

11. i. "නර්තන විෂය ප්‍රාථමික පන්තිකාමරයයේ සිසුන්ගේ නිර්මාණශීලීත්වය සංවර්ධනයට ප්‍රබල දායකත්වයක් සපයයි." සුදුසු නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. ප්‍රාථමික සිසුන් තුළ නර්තන කුසලතා වැඩිදියුණු කිරීමේ දී ගුරුවරයා මුහුණ දෙන අභියෝග හතරක් (04) සුදුසු උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. i. නාට්‍යකරණය ප්‍රාථමික පන්තිකාමරය තුළ විෂයයක් ලෙස ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට දායක කර ගැනීමේ යෝග්‍යතාව කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. නාට්‍යකරණය විෂයට අදාළ විවිධ සංකල්ප ඉස්මතු කරමින් ශිෂ්‍යයාගේ රසවින්දනය දියුණු කළහැකි ආකාරය සුදුසු උදාහරණ ගෙනහැර දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)

13. i. ළමා චිත්‍ර කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමේ දී ගුරු භූමිකාව කෙසේ වියයුතු ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. බහුවිධ බුද්ධි න්‍යායට අදාළ ඔබ කැමති ඒ බුද්ධි වර්ගයක් තෝරාගෙන ප්‍රාථමික අවධියේ දරුවන් තුළ එම බුද්ධිය සංවර්ධනය කිරීමෙහි ලා සුදුසු නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් යෝජනා කරන්න. එහි වලංගුතාව සෞන්දර්ය අධ්‍යාපනය ඔස්සේ විග්‍රහ කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.